දුරකථන
தொலைபேசி
Telephones } 011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary } 011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax } 011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E-mail } info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website } www.psc.gov.lk

මගේ අංකය
எனது இல.
My No. } PSC/DIS/01/06/2020

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2023.09. 27

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක :- 03/2023

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

<u>සාපරාධී ක්‍රියාවක් සිදු කර ඇතැයි සැක කෙරෙන රජයේ නිලධාරියෙකු සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමේදී එම සිදුවීමට අදාළ ලිපිලේඛන සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය</u>

රාජ්‍ය නිලධාරියකු විසින් යම් සාපරාධී ක්‍රියාවක් සිදු කර ඇතැයි සැක කෙරෙන අවස්ථාවකදී, එම සිදුවීම සඳහා අදාළවන ලිපිලේඛනවල මුල් පිටපත්, පොලිස් දෙපාර්තමේන්තුව වෙත හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත ලබා ගැනීම හෝ අධිකරණයේ ගොනු කිරීම සිදු කරනු ලැබේ. එවැනි තත්ත්වයක් තුළ, අදාළ නිලධාරියා සම්බන්ධව විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා/ ආයතන ප්‍රධානියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත වාර්තා කළ ද, ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය ලිපිලේඛනවල මුල් පිටපත්/විධිමත් පරිදි සහතික කරන ලද පිටපත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොවේ. එබැවින්, අදාළ විනය ක්‍රියාමාර්ගය ඵලදායි ලෙස හා කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම සඳහා එම තත්ත්වය බාධාවක් වී ඇති බවට එම කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර ඇත.

02. ඒ අනුව, ඉහත අවස්ථාවලදී අදාළ ලිපිලේඛන පොලිස් නිලධාරීන් හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් වෙත භාර දීමට පෙර, එම ලිපිලේඛන භාරයේ සිටින ආයතන ප්‍රධානියා විසින් ඒවා විධිමත් පරිදි සහතික කර පිටපත් තබා ගත යුතුය. මේ සම්බන්ධයෙන් දැනටමත් ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 27:6 වගන්තිය යටතේ විධිවිධාන සඳහන් කර ඇති අතර, එම විධිවිධාන කෙරෙහි තවදුරටත් මෙයින් අවධානය යොමු කරවමි.

03. තවද, එම මුල් පිටපත් තමා සන්තකයේ තබාගෙන ඇති බවට සහතික කරමින් අදාළ පොලිස් නිලධාරියාගේ හෝ විමර්ශන නිලධාරියාගේ අත්සන ද ලබා ගත යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

Ndaya

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව